දුරකථන/தொலைபேசிஇல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊ-මේල්/மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்விஅமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

"இசுருபாயா"
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } . . . . . . . . . . . . . . . . .

මගේ අංකය / எமது இல. / My No. } ED/01/21/03/06

දිනය / திகதி / Date } 2017.07.21

චක්‍රලේඛ අංක 30/2017

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේනාධිපති/ විදුහල්පතිවරුන් වෙත

**<u>ඩෙංගු රෝග මර්දනය පිළිබඳ විශේෂ වැඩසටහන</u>**

ඉහත කරුණට අදාළව මෙයට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 2010/22 හා2017.6.01 දිනැති ලිපිවලට අමතර වශයෙනි.

රට පුරා පැතිරයන ඩෙංගු රෝග තත්ත්වය දිනෙන් දින වැඩි වෙමින් පවතින අතර ඒ සඳහා මේවනවිටත් 100,000කට ආසන්න පිරිසක් ගොදුරු වී ඇති අතර 200කට අධික පිරිසක් මියගොස් ඇත. මෙයින් 30%ක්ම පාසල් යන වයසේ දරුවන් වීම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි. එසේම ඩෙංගු මදුරුවන් ක්‍රියාකාරිවන කාලයෙන් වැඩි කාලයක් දරුවන් ගත කරනුයේ පාසල් පරිසරය තුළය. එසේ හෙයින් පාසල් පරිසරය පිරිසිදුව, මදුරුවන්ගෙන් තොරව පවත්වා ගෙන යනවා මෙන්ම මදුරුවන් දෘෂ්‍ය කළ හැකි අවස්ථා අවම කිරීමට කටයුතු කිරීමද වැදගත්ය.

මේ සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කළ යුතු අතර දැනට ක්‍රියාත්මක වැඩසටහන්වලට අමතරව පහත ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය.අධ්‍යාපනය ලැබීමට නම් ඩෙංගු වසංගත තත්ත්වයෙන් දරුවාගේ ජීවිතය ආරක්ෂා වියයුතුය. ඉහළ අධ්‍යාපනයක් ලබාදෙමින් දැනුවත් සමාජයක් ගොඩනැඟීමට වෙහෙසවන ඔබ පළමුව ඔබේ පාසල සුරක්ෂිත පරිසරයක් බවට පත්කිරීමට ක්‍රියාකළයුතු වේ.

ඒ අනුව 2017/07/28 (සිකුරාදා) 29(සෙනසුරාදා) සහ 30 (ඉරිදා) යන තෙදින තුළ සියලු ම පාසල්වල දරුවන්,දෙමවුපියන්,ගුරුවරුන් , ආදි ශිෂ්‍යයින් සහ අසල්වාසීන් ඇතුලු පාසල් ප්‍රජාව සම්බන්ධකර ගනිමින් පාසල හා අවට පරිශ්‍රය පවිත්‍ර කිරීම සඳහා කටයුතු සිදුකර ඒ පිළිබඳව ලොග් සටහනක් තැබිය යුතුය.

සිකුරාදා දින උදයේ පාසල්වල අධ්‍යයන කටයුතු නොපවත්වා ඩෙංගු මර්දනය සඳහා පාසල් පරිශ්‍රය පිරිසිදු කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා සිකුරාදා දිනයේ පාසල් පැමිණෙන විට ශ්‍රමදානය සඳහා සුදුසු ඇඳුමකින් සැරසී පැමිණෙන ලෙස දරුවන් දැනුවත් කළ යුතුය.

සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හිදී ද මෙම ශ්‍රමදාන කටයුතු සිදුකළ යුතු අතර දුමායන කටයුතු සහ වෙනත් අවශ්‍ය උපදෙස් සඳහා ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්ගේ සහය ලබා ගැනීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි. පාසල් පරිසරය තුළ පවතින ඩෙංගු මදුරුවන් බෝවිය හැකි අවදානම් ස්ථාන කළමණාකරණය කිරීමට කටයුතු කළ යුතුය

- භාවිතයට නොගන්නා වැසිකිලි පද්ධති ඉවත් කිරීම
- අබලිද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කිරීම
- අඩක් නිමවූ කොන්ක්‍රීට් වහලවල වතුර නොරැදෙන සේ සකස් කිරීම
- වැසිකිලි පද්ධති ආශ්‍රිත මදුරුවන් බෝවියහැකි ස්ථාන පිළිසකර කිරීම
- පාසල් පරිශ්‍රය තුළ ඇති ජලය රැදෙන ස්ථාන නිසි කළමනාකරණය
- වැහිපීලි පවිත්‍ර කිරීම හා ඩෙංගු අවදානම් සහිත වැහිපීලි ඉවත්කිරීම

තවද පාසලේ කසල කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සහ මදුරුවන් බෝ විය හැකි ස්ථාන අඛණ්ඩව නිරීක්ෂණය කරමින් එම ස්ථාන තවදුරටත් මදුරුවන් බෝ නොවන සේ සකස් කර ගැනීමට සුදුසු ක්‍රමවත් වැඩපිළිවෙලක් පාසල් ප්‍රධානීන් විසින් සකස් කර ගත යුතුය.

ඩෙංගු මදුරුවන් සහිත පාසල් පරිසරය පාසලේ සිසුන්ට මෙන්ම ප්‍රජාවටද අහිතකර බලපෑමක් ඇති කරයි. එසේ හෙයින් සිසුන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්

පිටපත්- 1. ලේකම්, ජනාධිපති කාර්යාලය- කාරුණික දැන ගැනීමට
2. ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය - කාරුණික දැනගැනීමට
2. ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය - අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා